# *සමන්තපාසාදිකාවේ දැක්වෙන ථෙරවාදී බෞද්ධ කාලානුක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්*

ඊ.ඩබ්ලිව්.ඒ. හසිත චාමිකර ගුණසිංහ

**සංක්ෂේපය**

ඉතිහාසකරණයේ වැදගත් සංකල්පයක් ලෙස කාලානුක්‍රමය හඳුනාගත හැකි අතර එහිදී කිසියම් ප්‍රධාන සිදුවීමක් පාදක කොටගෙන ඒ ඔස්සේ පශ්චාත් සිදුවීම් අනුපිළිවෙලින් පෙළගැස්වීමක් සිදු කරනු ලබයි. එහෙත් ඉතිහාසය යනු කිසියම් නිශ්චිත ස්ථානයකින් ඇරඹී සිදුවන විකාශනයක් නොව හටගැනීම, පැවතීම හා විනාශවීම යන චක්‍රීය පදනම මත සිදුවන්නක් බව පිළිගත් බෞද්ධ ඉතිහාසඥයන්ට කාලානුක්‍රමය සඳහා කිසියම් ප්‍රධාන සිදුවීමක් උපුටා දැක්වීම අපහසු වූ බව පෙනේ. එනිසා එයට විසඳුමක් වශයෙන් ඔව්හු සම්බුද්ධ පරිනිර්වාණය යන සිදුවීමට ප්‍රමුඛත්වයක් ලබාදෙමින් එය පාදක කොටගෙන "බුද්ධ වර්ෂ" යනුවෙන් කාලය පෙළගැස්වීමට කටයුතු කළහ.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ විනය පිටකය සඳහා බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත අට්ඨකථාව වන *සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනාවේදී උපයෝගී කරගැනුණු ථෙරවාද බෞද්ධ කාලානුගත ක්‍රමය පිළිබඳ විමසා බැලීම ය. එහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් මූලාශ්‍රය අධ්‍යයනය යොදාගැනුණි.

*සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනාවේ විස්තර වන ශාසන ඉතිහාසයේ ඓතිහාසිකත්වය තහවුරු කිරීමට යොදාගැනුණු ප්‍රධාන කාලානුගත ක්‍රමය වන්නේ සම්බුද්ධ පරිනිර්වාණය පාදක කොටගෙන කාලය පෙළ ගැස්වීමයි. එහිදී සම්බුද්ධ පරිනිර්වාණය පාදක කොටගෙන දක්වන පළමු සිදුවීම වන්නේ සම්බුද්ධ පරිනිර්වාණය අරබයා සුභද්‍ර භික්ෂුවගේ "අභද්‍ර වචනය" පැවසූ සිද්ධියයි. එතැන් සිට ශාසන ඉතිහාසයේ වැදගත්කමක් උසුලන පළමු, දෙවන හා තෙවන ධර්ම සංගායනා පැවැත්වීම, අසෝක සිහසුනට පත්වීම සහ මහින්දාගමනය ආදී සිදුවීම් මෙකී කාලානුගත ක්‍රමයෙන් දක්වා තිබෙනු දැකිය හැකිය. ඒ හැරෙන්නට එක් එක් රජවරුන්ගේ රාජාභිෂේකය පදනම් කරගනිමින් විශේෂ සිදුවීම් ඉදිරිපත් කිරීම ද *සමන්තපාසාදිකාව* තුළින් දැකිය හැකිය. එහිදී අජාසත් රජුගේ පටන් මගධ රජවරුන්ගේ අභිෂේක කාලය පදනම් කොටගෙන ලක්දිව විජය රජුගේ සිට දෙවනපෑතිස් රජු දක්වා ලංකා රාජ නාමාවලිය පෙළ ගැස්වීමට කතුවරයා කටයුතු කර තිබීම විශේෂ කරුණකි.

මේ නිසා බුද්ධඝෝෂ හිමියන් හැකිතාක් නිවැරදිව කාලය දක්වමින් ශාසන ඉතිහාසය ඉදිරිපත් කිරීමට උත්සුක වූ බව පෙනේ. බුදුදහම ප්‍රත්‍යක්ෂය පදනම් කරගත්තක් වන හෙයින් ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි වූ මහරහතන් වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් දුටු අතිශය වැදගත් ශාසනික සිදුවීම වූ සම්බුද්ධ පරිනිර්වාණය ශාසන ඉතිහාසයේ ආරම්භය ලෙස යොදා ගැනීමට උන්වහන්සේ ගත් තීරණය හේතුවෙන් බෞද්ධ කාලානුක්‍රමයට ප්‍රධාන වශයෙන් භාවිත කොට ඇත. මේ හැරෙන්නට සමාජීය වශයෙන් සම්බුද්ධ පරිනිර්වාණයට ලැබුණු වැදගත්කම ඒ සඳහා රුකුලක් වන්නට ඇත.

මුඛ්‍ය පද ඃ
*සමන්තපාසාදිකාව*, බුද්ධඝෝෂ හිමි, ඉතිහාසකරණය, බෞද්ධ කාලානුගත ක්‍රමය, ථෙරවාදී බුදුදහම

Keywords:
*Samanthapāsādikā*, Buddhaghōshā Thero, Historiography, Buddhist Chronology, Theravada Buddhism

## හැඳින්වීම

මානව වර්ගයාගේ ප්‍රභවය සහ වර්ධනය පිළිබඳ ක්‍රමානුකූල විස්තරයක් වශයෙන් ඉතිහාසය හඳුනාගත හැකි ය. මෙහිදී ඉතිහාසකරණය (Historiography) නමින් හැඳින්වෙන්නේ ඉතිහාසයේ ඉතිහාසය හෙවත් ඉතිහාසය ලිවීමේ කලාවයි. ඒ තුළ භාවිත වන විවිධ සංකල්ප හා ක්‍රම ශිල්ප අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නක් ලෙස කාලානුක්‍රමය (Chronology) පෙන්වා දීමට පුළුවන. එකී ප්‍රමුඛස්ථානය හිමිව ඇත්තේ ඉතිහාසය රචනා කිරීමේදී ඒ එක් එක් සිදුවීම් සිදුවූ කාලය නිශ්චිතව දක්වාලීමෙන් එහි විශ්වසනීයත්වය තහවුරු කිරීමට කාලානුක්‍රමය ප්‍රබල ආධාරකයක් සපයන හෙයිනි. කාලානුක්‍රමය තුළදී සිදුවනුයේ එක් ප්‍රධාන සිදුවීමක් මුල්කොටගෙන අනුපිළිවෙලින් පශ්චාත් සිදුවීම් පෙළගැස්වීමකි.

ඉතිහාසකරණය ඇරඹුණු ඈත අතීතයේ පටන් කාලානුක්‍රම උපයෝගී කරගැනුණු බවට සාධක හමුවන අතර ඒවායින් රෝම ඉතිහාසඥයන් භාවිත කළ *Ab Urbe Condita* ක්‍රමය විශේෂ එකකි. මෙහිදී රෝම නගරය බිහිවූ දිනයේ සිට කාලය දැක්වීම ඔවුන් සිදුකර තිබේ (Blackburn & Holford-Strevens,1999:778–780). එහෙත් කල්යත්ම මධ්‍යකාලීන සමාජය තුළ ආගමික මුහුණුවරක් මත ගොඩනැගුණු කාලානුක්‍රම භාවිත වන්නට විය. ඒ සඳහා පදනම වූයේ කිතු උපතයි.

## කතෝලික ඉතිහාසකරණය සහ කාලානුක්‍රමය

මේ කාලය වන විට කතෝලික දහමට එරෙහිව ඇතිවෙමින් පැවති මතවාද මර්දනය කිරීමේ අරමුණින් සහ කතෝලික දහමේ ඉතිහාසය ඉදිරිපත් කිරීමේ අරමුණින් බයිබලය ඇතුළු කෘති පාදක කොටගනිමින් ආගමික ඉතිහාසයක් නිර්මාණයේ කිරීමේ කාර්යයේ කතෝලික ඉතිහාසඥයෝ නියැලී සිටියහ. ඒ යටතේ ඔවුන් විශ්ව ඉතිහාසයක් නිර්මාණය කිරීමේ කාර්යයට අතගැසූ අතර දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයා නිර්මාණය කළ බවට එන කතෝලික විශ්වාසය ඒ කාර්යය සඳහා ඔවුන් මෙහෙයවී ය. එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යධරණී ප්‍රදේශවල පැවති එකිනෙකට වෙනස් කාලානුක්‍රම රාශියක් පාදක කොටගත් සෙක්ස්ටස් ජුලියස් ඇෆ්‍රිකානුස් (ක්‍රි.ව. 160-240) නම් කතෝලික ඉතිහාසඥයා විසින් ක්‍රි.ව. 221 දී *Chronographiai* නමින් වෙළුම් පහකින් යුතු කෘතියක් පළ කරන ලදී. එම කෘතිය මගින්ඇෆ්‍රිකානුස් සම්භාව්‍ය හා බයිබල් කාලානුක්‍රම එක් කිරීමට උත්සහ ගෙන තිබුණි (Thee, 1984:54-57)

පසුකාලීනව එහි ආභාසය කතෝලික ආගමික ඉතිහාසයේ පියා වශයෙන් පිළිගැනෙන සිසේරියාවේ යුසේබියස් (ක්‍රි.ව. 260/65-339/40) වෙත නොඅඩුව හිමිවූ බව පෙනේ. කතෝලික බිෂොප්වරයෙකු වූ ඔහු විසින් රචනා කරනු ලැබූ *The Chronicle, Ecclesiastical History* සහ *Vita Constantini* නම් ප්‍රධාන කෘති ත්‍රිත්වය පල්ලිවංශ කතා නමින් හඳුන්වනු ලැබේ. ඉන් කාලානුක්‍රමය

පිළිබඳ වැදගත් වනුයේ *The Chronicle* නම් කෘතියයි. ඒ කෘතියේදී ඔහු මිසර, ඇසිරියානු, ග්‍රීක, රෝම ආදී සියලුම පැරණි කාලානුක්‍රම බයිබල් කාලානුක්‍රමය සමග එකට එක් කර තිබූ අතර ඒ සඳහා පැරණි තෙස්තමේන්තුව පාදක කොට ගත්තේ ය. මෙහි විශේෂත්වයක් වූයේ දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයා මැවීමේ සිදුවීමේ සිට ඒ දක්වා කාලය වර්ෂ කීයක් ද යන්න යුසේබියස් විසින් දක්වා තිබීමයි (González, 2010:129-135).

මෙකී අධ්‍යයන උපයෝගී කොටගත් කතෝලික ඉතිහාසඥයෝ *Anno Mundi* නමින් දෙවියන් වහන්සේ විසින් ලෝකය මැවීමේ සිදුවීමේ සිට කාලය පෙළගැස්වීමක් සහ *Anno Domini* ලෙස ක්‍රිස්තුස් වහන්සේගේ උපතේ සිට කාලය පෙළගැස්වීමක් භාවිත කරමින් කතෝලික ඉතිහාසකරණයේ නියැලුණහ. එහෙත් මේ ක්‍රමය නිසා ඔවුන්ගේ ඉතිහාසකරණය රේඛීය පදනමකට සීමා වූ බවක් පෙනෙන්නට තිබේ.

## බෞද්ධ ඉතිහාසකරණය සහ කාලානුක්‍රමය

කිසියම් නිශ්චිත ස්ථානයකින් ඇරඹී ක්‍රමිකව සිදුවන විකාශනයක් නොමැති බවත්, හටගැනීම, පැවතීම හා විනාශවීම (උප්පාද, ඨිති සහ භංග) යන සංකල්පය මත පදනම් වූ පැවැත්මක් ලෝකයේ පවතින බවත් බෞද්ධ ඉගැන්වීම වූ අතර මෙනිසා බෞද්ධයා තුළ පැවතියේ ඉතිහාසය සම්බන්ධ චක්‍රීය සංකල්පයකි. එහි ප්‍රතිඵලය වූයේ කතෝලික ඉතිහාසඥයන්ට මෙන් කිසියම් එක් ප්‍රධාන සිදුවීමක් ස්වකීය කාලානුක්‍රමය සඳහා යොදාගැනීමට බෞද්ධ ඉතිහාසඥයන්ට නොහැකිවීමයි.

කෙසේ වෙතත් එකී ගැටලුව ජයගැනීමට තථාගත සම්බුද්ධ පරිනිර්වාණය යන ප්‍රධාන සිදුවීම පාදක කොටගෙන කාලානුක්‍රමයක් බෞද්ධ ඉතිහාසකරණය සඳහා නිර්මාණය කිරීමට ඔව්හු සමත්වූහ. මේ සඳහා පදනම සැකසුණේ බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව පැවැත්වුණු පළමු ධර්ම සංගායනාවත් සමග බව පෙනෙන්නට තිබේ. බුදුදහම ප්‍රත්‍යක්ෂය මත පදනම් වුණු ඉගැන්වීමක් වන හෙයින් ප්‍රථම ධර්ම සංගායනාවට සහභාගි වූ මහ රහතන් වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන්ම දුටු අතිශය වැදගත් ශාසනික සිදුවීම වූයේ සම්බුද්ධ පරිනිර්වාණයයි. එකී පදනම මත පිහිටා සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූ දිනය, මාසය සහ වර්ෂය ශාසන ඉතිහාසයේ ආරම්භය ලෙස යොදා ගැනීමට උන්වහන්සේ තීරණය කළ බව පෙනේ (ඉලංගසිංහ,2000:4-5). පසුකාලීනව මෙය"බුද්ධ වර්ෂ" නමින් ව්‍යවහාරයට පැමිණියේ ය.

මීට අතිරේකව සිදුහත් තවුසා සම්බුද්ධත්වයට පත්වීමේ දිනයේ සිට කාලය පෙළගැස්වීමක් ද (බෝධි වර්ෂ), එක් එක් රජවරුන්ගේ අභිෂේකයේ සිට කාලය පෙළගැස්වීමක් හා චන්ද්‍ර මාස ක්‍රමය අනුව කාලය පෙළගැස්වීමක් ද බෞද්ධ ඉතිහාසකරණය තුළ භාවිත වී ඇති බව ලාංකීය බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය පිරික්සීමේදී පැහැදිලි වේ. පසුකාලීන ජ්‍යොතිෂය තුළ වැඩි වශයෙන් භාවිත වන "ශකරාජ වර්ෂ ක්‍රමය" බෞද්ධ ඉතිහාසකරණය තුළ යොදාගැනුණු බව ද විශේෂයෙන් උඩරට රාජධානි සමයේ ලේඛන පිරික්සීමේදී දැකගැනීමට පුළුවන.

මෙම ලිපියෙන් අපේක්ෂා කෙරෙනුයේ ක්‍රි.ව පස්වන සියවසේදී පමණ මහාපච්චරී අට්ඨකථාව මූලාශ්‍රය කර ගනිමින් බුද්ධඝෝෂ හිමියන් විසින් විනය පිටකය උදෙසා රචිත

*සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනා කොටස තුළ ශාසන ඉතිහාසය දැක්වීමේදී බෞද්ධ කාලානුගත ක්‍රමය උපයෝගී කොටගෙන ඇති අන්දම විමසා බැලීමයි.

## බෞද්ධ අටුවා ග්‍රන්ථ

බුද්ධ කාලයේ පටන්ම බුදුන් වදාළ දේශනාවන්හි ගැටලු සහිත ස්ථාන සඳහා විස්තරාත්මක අර්ථ සැපයීම සඳහා කටයුතු සම්පාදනය වුණු අතර අට්ඨකථාවන්හි ආරම්භය වූයේ එයයි (චන්දරතන හිමි,2006:18). ක්‍රි.පූ. තෙවැනි සියවසේ ලක්දිවට බුදුදහම හඳුන්වාදීමත් සමග ලක්වැසියන්ට ත්‍රිපිටක ධර්මයේ ඇති ගැටලු තැන් පිළිබඳ විස්තරාත්මක අර්ථ සැපයීම සඳහා මිහිඳු මාහිමියන්ගේ පුරෝගාමීත්වයෙන් සිංහල අටුවා ග්‍රන්ථ සම්පාදනය කෙරුණි (චන්දරතන හිමි,2006:42). ඒ සඳහා සම්බුද්ධ පරිනිර්වාණයේ සිට ලංකාවට බුදුදහම රැගෙන ඒම දක්වා වූ කාල සීමාවට අදාළ ශාසන ඉතිහාසය ඇතුළත් කරන්නට මිහිඳු මාහිමියන් කටයුතු කරන්නට ඇත්තේ එවකට දඹදිව පැවති ශාසනික නිකාය භේදය හේතුවෙන් තමන්වහන්සේ දේශනා කරනු ලබන්නේ බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛ දේශන බව ලංකාවාසීන්ට ඒත්තු ගැන්වීමට විය යුතු ය (ගුණවර්ධන,2005:116).

මෙකී සිංහල අටුවා ග්‍රන්ථ පාලියට පරිවර්තනය කිරීම ක්‍රි.ව. පස්වන සියවසේදී පමණ ආරම්භ වූ අතර එකී කාර්යය සාර්ථක කරගැනීමට හැකිවූයේ බුද්ධඝෝෂ හිමියන්ට ය (චන්දරතන හිමි,2006:21).උන්වහන්සේ විසින් රචනා කළ අටුවා ග්‍රන්ථ අතර *විසුද්ධිමාර්ගය, සමන්තපාසාදිකාව, සුමංගලවිලාසිනී, පපඤ්චසූදනී, සාරත්ථපකාසිනී* සහ *මනෝරථපූරණිය* ප්‍රධාන වේ. ඒ අතරින් මහාපච්චරී අට්ඨකථාව ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය කර ගනිමින් උන්වහන්සේ විසින් විනය පිටකය සඳහා රචනා කෙරුණු අට්ඨකථාව වූයේ *සමන්තපාසාදිකාවයි* (චන්දරතන හිමි,2006:42-43). "සෑම ආකාරයෙන්ම ප්‍රසාදය උපදවයි" යන අරුතැතිව *සමන්තපාසාදිකා* යැයි නම් තැබුණු විනයට්ඨකතාව බාහිර නිදාන වණ්ණනා, ප්‍රථම පාරාජිකා වණ්ණනා, ද්විතීය පාරාජිකා වණ්ණනා, තෘතිය පාරාජිකා වණ්ණනා සහ චතුර්ථ පාරාජිකා වණ්ණනා ආදී වශයෙන් කොටස් කීපයකින් සමන්විත ය.

සම්බුද්ධ පරිනිර්වාණයේ සිට තෙවැනි ධර්ම සංගායනාව දක්වා ශාසන ඉතිහාසය සහ නවරට සසුන් පිහිටුවීම, ඒ යටතේ ලක්දිව බුදුසසුන පිහිටුවීම හා එතැන් සිට අරිට්ඨ තෙරණුවන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිස විනය පිටකය ආචාර්ය පරම්පරාවෙන් රැගෙන ඒම දක්වා ශාසන ඉතිහාසය *සමන්තපාසාදිකාවේ* ආරම්භක කොටස වන බාහිර නිදාන වණ්ණනාවේ ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ. මීට අමතරව මේ කාලයට අදාළ මගධ රාජ නාමාවලිය හා ලංකාවේ විජය රජුගේ සිට දෙවනපෑතිස් රජු දක්වා රාජ නාමාවලිය ප්‍රධාන කතා පුවතට සමගාමීව ඇතුළත් කොට තිබෙනු දැකිය හැකි ය.

## *සමන්තපාසාදිකාවේ අනුගමනය කෙරුණු බෞද්ධ කාලානුක්‍රමය*

*සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනාවේ ඉදිරිපත් කොට ඇති ශාසන ඉතිහාසයේ ඓතිහාසිකත්වය තහවුරු කරනු වස්, ඒවා බෞද්ධ කාලානුගත ක්‍රමය යටතේ පෙළගැස්වීමට බුද්ධඝෝෂ හිමියන් කටයුතු කර තිබෙනු දකගැනීමට පුළුවන. එහිදී *සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනාවේ භාවිත වන බෞද්ධ කාලානුගත ක්‍රම වනුයේ,

- සම්බුද්ධ පරිනිර්වාණය
- සංගායනා පැවැත්වූ කාලය
- රජවරුන්ගේ අභිෂේකය යන ත්‍රිත්වයයි.

එයින් ශාසන ඉතිහාසය තුළ වැදගත් යැයි සැලකිය හැකි සිදුවීම් දැක්වීමට පමණක් සම්බුද්ධ පරිනිර්වාණය පදනම් කරගත් කාලානුක්‍රමය යොදාගැනුණු බව පැහැදිලිව දැකගැනීමට පුළුවන. එය හුදෙක් බුද්ධඝෝෂ හිමියන් පමණක් අනුගමනය කළ සම්ප්‍රදායක් නොව පොදුවේ වංසකතාකරුවන් පවා අනුගමනය කළ සම්ප්‍රදායක් වූ බව පෙනෙන්නට තිබේ. ශාසන ඉතිහාසය තුළ සම්බුද්ධ පරිනිර්වාණය සුවිශේෂී සිදුවීමක් වන හෙයින් එය සිදුවූ කාලය පදනම් කොටගෙන ඉදිරිපත් කරන්නට ඇති සිදුවීම ද ඒ තරම්ම වැදගත් එකක් විය යුතුය යන පිළිගැනීම සාහිත්‍යකරුවන් තුළ පැවතීම එයට හේතුවන්නට ඇත.

*සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනාවේ සම්බුද්ධ පරිනිර්වාණය පාදක කොටගෙන කාලය දක්වන පළමු සිදුවීම වශයෙන් හඳුනාගත හැක්කේ බුදුන්ගේ පිරිනිවීම අරබයා සුභද්‍ර නම් භික්ෂුව විසින් සිදුකළ අභද්‍ර ප්‍රකාශයයි. බුද්ධ පරිනිර්වාණයෙන් දින සතක් ඉක්ම ගිය තැන සුභද්‍රගේ මේ පිළිබඳ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ සිහිපත් කළ බව *සමන්තපාසාදිකාව* දක්වයි (*ස.පා.-ප.භා.*,2012:3)[1]. බෞද්ධ කාලානුගත ක්‍රමය පිළිබඳ අවබෝධයක් නොමැතිව මෙම සිදුවීම දක්වන්නට ඇතැයි කිසිවෙකුට තර්ක කළ හැකි වුව ද, බුදු සසුනේ චිරස්ථිතිය තහවුරු කළ එසේම බෞද්ධ ඉතිහාසකරණය සඳහා අඩිතාලම දැමූ පළමු ධර්ම සංගායනාවට මෙම සිදුවීම මඟ පෑදූ හෙයින් එය එසේ ලඝු කොට දැක්විය නොහැකිය.

අනතුරුව බුද්ධ පරිනිර්වාණය පාදක කොටගෙන කාලය දක්වන සිදුවීම වනුයේ බුදුන් වහන්සේගේ පිරිනිවීමෙන් වසර සීයක් ඉක්මයාමෙන් විශාලා මහනුවර වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේ දස වස්තූන් කැපයැයි ප්‍රකාශ කිරීමත් සමඟ ඇතිවූ තත්ත්වයට පිළියම් ලෙස දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමයි (*ස.පා.-ප.භා.*,2012:19)[2]. ශාසන ඉතිහාසය තුළ දෙවැනි ධර්ම සංගායනාව ආකාර කිහිපයකට වැදගත්වන්නකි. වජ්ජිපුත්තක භික්ෂූන්ගේ අවිනයවාදී හැසිරීම මර්දනය කොට ස්ථවිරවාදීන්ගේ බලය නැවතත් තහවුරු කරගත හැකිවීම සහ පළමුවරට ථෙරවාදය සහ මහායානය වශයෙන් භික්ෂු සංඝයා භේදවීම දෙවැනි සංගායනාවේ ප්‍රතිඵල වන හෙයින් ඒ සන්ධිස්ථාන සිදුවීම් පිළිබඳ විශේෂ අවධානයක් *සමන්තපාසාදිකා* කතුවරයා දක්වන්නට ඇත.

මේ අවස්ථාවේදීම සංගායනා පැවැත්වූ කාලය ද කාලානුගත ක්‍රමයක් ලෙස යොදාගෙන තිබෙන අයුරු දැකගත හැකිය. ඒ දෙවැනි සංගායනාව සිදුකොට නිමකළ මහතෙරුන් වහන්සේ අනාගතයෙහි ශාසනයට සිදුවන උවදුරු පිළිබඳ දිවැසින් බැලීමේදී මෙයින් වසර එකසිය දහ අටක් ගෙවුණු තැන පැළලුප් නුවර ධර්මාශෝක නම් රජෙකු පහළ වන බව දක්වා තිබීමෙනි (*ස.පා.*-

[1]. "…..ආයස්මා මහාකස්සපො සත්තාහපරිනිබ්බුතෙ භගවති සුභද්දෙන බුඩ්ඪපබ්බජිතෙන……..වුත්තවචන මනුස්සරන්තො……."

[2]. "….. අථානුක්කමෙන ගච්ඡන්තෙසු රත්තින්දිවෙසු වස්සත පරිනිබ්බුතෙ භගවති වෙසාලිකා වජ්ජිපුත්තකා භික්ඛූ වෙසාලියං……දස වත්ථූනි දීපෙසුං….. "

*ප.භා.*,2012:19).[3] අනතුරුව අතුරු කතා කීපයකින් පසුව බින්දුසාර රජුගේ පුත් අශෝක කුමරු තම සොයුරන් ඝාතනය කරවා සිහසුන අත්පත් කොටගෙන රාජාභිෂේකයට පත්වන සිදුවීම දක්වා ඇත. එහිදී බුදුන්වහන්සේගේ පිරිනිවීමෙන් දෙසිය දහඅටවන වර්ෂයේදී ඔහු දඹදිව ඒකරාජ්‍යාභිෂේකයට පත්වූ බව සඳහන් කොට තිබේ (*ස.පා.-ප.භා.*,2012:24).[4]

විශාල මිනිස් සංහාරයක් සිදුකරමින් සිහසුනට පත් වූ අශෝක අධිරාජයාගේ රාජාභිෂේකය සිදුවූ වර්ෂය බුදුන්ගේ පිරිනිවීමේ සිට දක්වන්නට රචකයා කටයුතු කරන්නට ඇත්තේ පසුකලෙක ධර්මාශෝක නමින් ශාසනය උදෙසා රජු කළ අපරිමිත සේවය හේතුවෙන් විය යුතු ය. විශේෂයෙන්ම තෙවැනි ධර්ම සංගායනාව පවත්වා නව රට සසුන් පිහිටුවීම අශෝක විසින් නොකරන්නට, වර්තමානය දක්වා සසුන සුරැකී නොපවතින්නට ද අවකාශ තිබිණි. එසේම බුදුන් පිරිනිවීමෙන් වසර දෙසිය දහ අටක පසුව අශෝක සිහසුනට පත්වූ බව *සමන්තපාසාදිකාවේ* දැක්වීම තුළින් දෙවැනි ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගත් මහතෙරුන් වහන්සේ දිවැසින් අශෝක පිළිබඳ දුටු විස්තරය එම රචකයා විසින් සනාථ කිරීමට ද කටයුතු කර තිබෙනු දැකිය හැකිය.

මෙයින් පසු *සමන්තපාසාදිකාවේ* බුදුන්ගේ පිරිනිවීම පාදක කොටගෙන කාලය දැක්වීම සිදුකොට ඇත්තේ එක් සිදුවීමක් උදෙසා පමණකි. ඒ ලංකාද්වීපයට මහින්දාගමනය සිදුවීම පිළිබඳව ය. එහිදී බුදුන් පිරිනිවීමෙන් වර්ෂ දෙසිය තිස් හතේදී මහාමහින්ද මාහිමියන් ඉට්ඨිය ආදී තෙරුන් වහන්සේලා සමග මෙරටට වැඩම කොට ශාසනය පිහිට වූ බව දක්වා තිබේ (*ස.පා.-ප.භා.*,2012:42).[5] අද දක්වා මෙරට අවිච්ඡින්නව පැවත එන බුදුසසුන සඳහා ශක්තිමත් අඩිතාලමක් දැමීම මහින්දාගමනය තුළින් සිදුවූ අතර බුදුන් වහන්සේ මෙරටට තෙවරක් වැඩම කිරීමේ අවස්ථාවලට පසුව එන වැදගත්ම ශාසනික සිදුවීම මෙය වන හෙයින් ඒ සඳහා බුදුන් පිරිනිවීමේ සිට කාලය දැක්වීමට *සමන්තපාසාදිකා* රචකයා කටයුතු කරන්නට ඇත.

විනය අට්ඨකථාව රචනා කිරීමේදී නිධාන කථාවක් වශයෙන් රචනා කෙරුණු බාහිර නිදාන වණ්ණනාවේ එන බුදුන් පිරිනිවීමේ සිට කාලය දක්වා තිබෙන කාලානුගත ක්‍රමය පසුව ලියවුණු *මහාවංසය* වැනි මූලාශ්‍රය විසින් ද අනුගමනය කර තිබෙනු තුලනාත්මකව මේ පිළිබඳ විමසා බැලීමේදී දැකිය හැකිය.

එහිදී *සමන්තපාසාදිකාවේ* පරිද්දෙන්ම බුදුන් පිරිනිවීමෙන් සත් දිනක් ගෙවුණු තැන සුභද්ද නම් මහළු පැවිද්දාගේ අභද්‍ර ප්‍රකාශය පිළිබඳ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සිහිපත් කළ බව *මහාවංසය* දක්වයි (*මහාවංසය*,2006:03:06).[6] ඒ අවස්ථාවේදී හැරෙන්නට පසුව කිසිම ස්ථානයක පළමු සංගායනාව පිළිබඳ තොරතුරු දැක්වීමේදී රචකයා කාලානුක්‍රමයක් උපයෝගී කොටගත් බවක්

---

[3]. ".....එවම්මං දුතියසංගීතිං සංගායිත්වා තෙ ථෙරා උප්පජ්ජිස්සති නුඛො අනාගතෙපි සාසනං එවරූපං අබ්බුදන්ති ඔලොකයමානා ඉදං අද්දසංසු. ඉතො වස්සසතස්ස උපරි අට්ඨාරසමෙ වස්සෙ පාටලීපුත්තෙ ධම්මාසොකො නාම රාජා උප්පජ්ජිත්වා සකලජම්බුදීපෙ රජ්ජං කාරෙස්සති...."

[4]. ".....තෙන ඛො පන සමයෙන බින්දුසාරස්ස රඤ්ඤො එකසතපුත්තා අහෙසුං. තෙ සබ්බේ අසොකො අත්තනා සද්ධිං ඒකමාතිකං තිස්ස කුමාරං ඨපෙත්වා ඝාතෙසි. ඝාතෙන්තො ච චත්තාරි වස්සානි අනභිසිත්තොව රජ්ජං කාරෙත්වා චතුන්නං වස්සානං අච්චයෙන තථාගතස්ස පරිනිබ්බානතො ඨිත්තං වස්සසතානං උපරි අට්ඨාරසමෙ වස්සෙ සකලජම්බුදීපෙ ඒකරජ්ජාභිසෙකං පාපුණි.... "

[5]. ".....එවං ඉට්ඨියාදීහි සද්ධිං ආගනත්වා පතිට්ඨහන්තො ච ආයස්මා මහින්දථෙරො සම්මාසම්බුද්ධස්ස පරිනිබ්බාණතො ඨින්නං වස්සතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙ ඉමස්මිං දීපෙ පතිට්ඨහීති වෙදිතබ්බො....."

[6]. ලොකනාථො දසබලෙ සත්තාහපරිනිබ්බුතෙ-දුබ්භාසිතං සුභද්දස්ස වුඩ්ඪස්ස වචනං සරං

නොපෙනේ. අනතුරුව *සමන්තපාසාදිකා* රචකයා සේම දෙවැනි සංගායනාව පිළිබඳ අවධානය යොමුකරන මහාවංසකතාකරුවා සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසුව කාලාශෝක රජ සමයේ විශාලාවේ වජ්ජිපුත්තක යන නම් ලැබූ භික්ෂූන් විසින් දසවස්තු පරිභෝගයෙන් කළා වූ අවිනයවාදී හැසිරීම දක්වා, දෙවැනි සංගායනාව පිළිබඳ විස්තර කිරීම අරඹයි (*මහාවංසය*,2006:04: 08-09).[7]

ඉන් අනතුරුව තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දෙසිය දහ අටකින් අශෝක සිහසුනට පත්වූ වග (*මහාවංසය*,2006:05:21)[8] දක්වන වංසකතාකරුවා පසුව තෙවැනි ධර්ම සංගායනාව සිදු වූ කාලවකවානු දැක්වීම සඳහා කාලානුක්‍රමයක් භාවිත කළ බවක් නොපෙනේ. එසේම මහින්දාගමනය සිදු වූ කාලය පිළිබඳ දැක්වීමට වුව ද *මහාවංසය* කාලානුක්‍රමයක් භාවිත කළ බවක් දැකිය නොහැකිමුත් *වංසත්ථප්පකාසිනියේ* එය "....මෙසේ ඉට්ඨිය ආදීන් සමග අවුත් මෙහි බට ආයුෂ්මත් මහින්ද ස්ථවිරයන් වහන්සේ බුදුන් පිරිනිවී දෙසිය සතිස් වන වස්හි මේ ලක්දිව්හි පා තැබූහ....."එය දක්වා තිබේ (*වංසත්ථප්පකාසිනී*,2001:249).

මේ අන්දමින් *සමන්තපාසාදිකාවෙන්* ඉදිරිපත් කෙරෙන කාල වකවානු අනෙක් මූලාශ්‍රය සමග පිරික්සා ඇති අන්දම පහතින් දක්වා තිබේ.

| | ***සමන්තපාසාදිකාව*** | ***මහාවංසය*** | ***පූජාවලිය*** | ***සද්ධර්මරත්නාකරය*** |
|---|---|---|---|---|
| | තථාගත පරිනිර්වාණයෙන් වසර | | | |
| සුභද්‍රගේ අභද්‍ර වචනය මහාකාශ්‍යප තෙරුන් සිහිපත් කිරීම | සත් දිනකින් | සත් දිනකින් | - | සත් දිනකින් |
| පළමු ධර්ම සංගායනාව | සත් මසකින් (නිමාවීම) | සත් මසකින් (නිමාවීම) | සත් මසකින් (නිමාවීම) | - |
| දෙවැනි ධර්ම සංගායනාව | 100 කින් | 100 කින් | - | 100 කින් |
| තෙවැනි ධර්ම සංගායනාව | - | - | 218 කින් | 235 කින් |
| මහින්දාගමනය | 237 කින් | - | 237 කින් | - |

එහිදී මුල්කාලීනව ලියවුණු මූලාශ්‍රයක් වශයෙන් ශාසනික සිදුවීම් වැඩිගණනක කාලය පිළිබඳ තොරතුරු දැක්වීමට *සමන්තපාසාදිකා* රචකයා කටයුතු කර ඇති බව පෙනේ.

---

7.අතීතෙ දසමෙ වස්සෙ කාලසොකස්ස රාජිනො-සම්බුද්ධපරිනිබ්බානා එවං වස්සසතං අහු
තදා වෙසාලියා භික්ඛු අනෙකෙ වජ්ජිපුත්තකා - සිංගිලොණං ද්වඞ්ගුලං ච තථා ගාමන්තරම්පි ච

8.ජිනනිබ්බානතො පච්ඡා පුරෙ තස්සාභිසෙකතො-සාට්ඨාරසං වස්සසතද්වයං එවං විජානියං

බුදුන්ගේ පිරිනිවීමේ සිට කාලය දක්වන කාලානුක්‍රමය හැරෙන්නට *සමන්තපාසාදිකා* බාහිර නිදාන වණ්ණනාවේ බහුලව භාවිතා වී ඇත්තේ රජුන්ගේ අභිෂේක පදනම් කොටගත් කාලය දක්වන කාලානුක්‍රමයයි. එහිදී ශාසන ඉතිහාසයේ විශිෂ්ටතම රජු වශයෙන් සැලකෙන අශෝක රජුගේ රාජාභිෂේකය පදනම් කොටගෙන සිද්ධි වැඩි ප්‍රමාණයක් දක්වා තිබෙන බව පෙනෙන අතර එයට හේතුවන්නට ඇත්තේ එකී කාලය තුළ සිදුවූ ශාසනික පුනර්ජීවය සහ එම සිදුවීම් බොහොමයක් ලංකාවේ බුදුසසුන පිහිටුවීම සම්බන්ධයෙන් වැදගත් වන නිසා විය යුතු ය.

එසේම අශෝක රජු විසින් තම ලිපිවල බොහෝවිට ස්වකීය අභිෂේකයේ සිට කාලය දක්වා තිබීම ද එයට හේතුවක් වන්නට ඇත. උදාහරණයක් ලෙස අශෝක රජුගේ 13 වන ගිරි ලිපියේ රජු විසින් සිදුකළ කාලිංග මහා සංග්‍රාමය පිළිබඳව එන සඳහන මෙසේ ය.

"...අඨවෂාභිසිතෂා දෙවානංපියස පියදෂිනෙ ලාජිනෙ කලිගයා විජිතා දියඪමාතෙ...."

(ඤාණවිමල හිමි,2000:27)

එනම් "......අභිෂේක කොට අටවස් ඇති දෙවියන්ට ප්‍රිය වූ පියදස්සී රජු විසින් කාලිංගයෝ දිනන ලදහ....... (ඤාණවිමල හිමි,2000:30) යනුවෙනි. මේ හැරෙන්නට ලාංකේය පාලකයන් ද ස්වකීය අභිෂේක පදනම් කොටගෙන කාල වකවානු දක්වන සෙල්ලිපි රැසකි.

පළමුව රජු බෞද්ධයකු බවට පත්වූ පුවත දක්වන *සමන්තපාසාදිකා* රචකයා රජු අභිෂේකයෙන් වසර තුනක් ගතවන තෙක් බාහිර පාෂාණ්ඩයන්ට සංග්‍රහ කළ බවත්, සිවුවන අවුරුද්දේ බුදුසසුනේ පැහැදුණු බවත් සඳහන් කරයි (*ස.පා.-ප.භා.*,2012:25).[9] *සමන්තපාසාදිකාවේ* එන අශෝක රජුගේ අභිෂේකයේ සිට එහෙත් මේ පිළිබඳ අසෝක ශිලා ලේඛන ඇසුරින් අධ්‍යයනයක නිරත වූ බෙල්ලන ඤාණවිමල නාහිමියන් සඳහන් කරන අන්දමට රජු බෞද්ධයකු බවට පත්ව ඇත්තේ රජුගේ අභිෂේකයෙන් අටවන වර්ෂයේදී ය. එසේම රජු බෞද්ධයකු බවට පත් වුව ද, අන්‍යාගමික පූජකවරුන්ට ද නොකඩවා පුද සත්කාර පවත්වන ලෙස නියම කොට ඇති බව ද උන්වහන්සේ වැඩිදුරටත් සඳහන් කරති (ඤාණවිමල හිමි,2000:3-4).

අනතුරුව අශෝක රජුගේ අභිෂේකයේ සිට කාලය දක්වා ඇත්තේ රජුගේ දරුවන් වූ මහින්ද හා සංඝමිත්තාගේ පැවිදි දිවිය සම්බන්ධ තොරතුරු සඳහා ය. එහිදී මහින්ද කුමරු සහ සංඝමිත්තා කුමරිය පැවිදි බව ලැබුවේ රජුගේ අභිෂේකයෙන් සයවන වර්ෂයේ බව *සමන්තපාසාදිකාව* දක්වයි. (*ස.පා.-ප.භා.*,2012:29)[10] පසුව මිහිඳු හිමියන් ත්‍රිපිටක ධර්මය උගෙන දහසක් පමණ භික්ෂූන්ට ප්‍රධාන වූයේ අසෝක රජුගේ අභිෂේකයෙන් නවවන වර්ෂයේ බවත් (*ස.පා.-ප.භා.*,2012:29-30)[11], රජුගේ

---

9."....රාජ කිර අභිසේකං පාපුණිත්වා තීණි යෙව සංවච්ඡරානි බාහිරකපාසණ්ඩං පරිගණ්හි, චතුත්ථෙ සංවච්ඡරෙ බුද්ධසාසනෙ පසීදි...."

10."....සො තස්මිං යෙව උපසම්පදායමණ්ඩලෙ සහ පටිසම්භිදාහි අරහත්තං පාපුණි....තදා සංඝමිත්තා අට්ඨාරසවස්සා හොති. තං පබ්බජිතමත්තං තස්මිං යෙව සීමාමණ්ඩලෙ සික්ඛාය පතිට්ඨාපෙසුං උභින්නං පබ්බජිතකාලෙ රාජ ඡවස්සාභිසෙකො හොති...."

11."....අථ මහින්දත්ථෙරො උපසම්පන්න කාලතොප්පභුති අත්තනො උපජ්ඣායස්සෙව සන්තිකෙ ධම්මඤ්ච විනයඤ්ච පරියාපුණන්තො ද්වෙපි සංගීතියෝ ආරූළ්හං තිපිටකසංගහිතං සාට්ඨකථං සබ්බං ථෙරවාදං තිණ්ණං වස්සානං අබ්භන්තරෝ උග්ගහෙත්වා අත්තනො උපජ්ඣායස්ස අන්තේවාසිකානං සහස්සමත්තානං භික්ඛූනං පාමොක්ඛො අහොසි. තදා අසොකො ධම්මරාජා නවවසසාභිසෙකො හොති...."

අභිෂේකයෙන් දහඅටවන වර්ෂයේදී උන්වහන්සේ මෙරටට වැඩම කළ බවත් (*ස.පා.-ප.භා.*,2012:42)[12] වැඩිදුරටත් එහි සඳහන් වේ.

මේ හැරෙන්නට කුන්තපුත්තතිස්ස නම් මහරතහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම පිළිබඳ පමණක් අශෝක රජුගේ අභිෂේකය පදනම් කොටගෙන කාලය දැක්වීමට *සමන්තපාසාදිකා* රචකයා කටයුතු කර තිබෙන දැකිය හැකි ය. රජුගේ අභිෂේකයෙන් අටවන වර්ෂයේදී රෝගයක් සඳහා ගිතෙල් සොයමින් පිණ්ඩපාතයේ ගිය කුන්තපුත්තතිස්ස මහරහතන් වහන්සේ එය නොලැබ අවසානයේදී රෝගය උත්සන්නව භික්ෂූන්ට අවවාද කොට පිරිනිවන් පා තිබේ (*ස.පා.-ප.භා.*,2012:30).[13] ඤාණවිමල නාහිමියන් සඳහන් කරන අන්දමට රචකයා මේ සිදුවීම සඳහා විශේෂත්වයක් ලබාදෙන්නට ඇත්තේ කුන්තපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ අභාවයෙන් පසුව ලාභ සත්කාර අපේක්ෂාවෙන් ශාසනයට ඇතුළත් වූ තීර්ථකයන් ප්‍රමාණයෙන් වැඩි වූ නිසා විය යුතු ය (ඤාණවිමල හිමි,2000:3).

අශෝක රජුගේ අභිෂේකයට පමණක් සීමාවෙමින් සිදුවීම් දැක්වූ සමන්තපාසාදිකාකරුවා ලක්දිවට මහින්දාගමනය සිදුවූ පුවත දැක්වීමෙන් අනතුරුව අජාසත් රජුගේ අභිෂේකයේ සිට අශෝකගේ අභිෂේකය දක්වා සහ විජය රජුගේ අභිෂේකයේ සිට දෙවනපෑතිස් රජුගේ අභිෂේකය දක්වා මගධ හා ලංකා රාජ නාමාවලි රාජ්‍ය කාලය සමග පිළිවෙලින් දක්වා තිබේ. අවිච්ඡින්නව රාජ වංශ පැවතුණු අන්දම සවිස්තරාත්මක එහි දැකගත හැකි අතර මගධ රජුන්ගේ අභිෂේක පාදක කොටගෙන ලක්දිව සිහසුන් පැමිණියවුන් හා වැදගත් තොරතුරු මෙහිදී ඉදිරිපත් කර ඇත. එයට හේතුව වන්නට ඇත්තේ ශාසන ඉතිහාසය මගධ රාජධානි ඉතිහාසය සමග ලඟින්ම බැඳී පැවතීම විය හැකි බව මහාචාර්ය රණවීර ගුණවර්ධන සඳහන් කරයි (ගුණවර්ධන,2005:116) මෙම සවිස්තරාත්මක තොරතුරු හැදෑරීමේ පහසුව තකා එය පහත පරිදි වගු ගත කළ හැකි ය.

| **මගධ රාජාවලිය** | **පොදු සිදුවීම්** | **ලංකා රාජාවලිය** |
|---|---|---|
| අජාසත්ත (රාජ්‍ය කාලය වසර 26)<br>අභිෂේකයෙන් 8 වන වර්ෂය | බුදුන් වහන්සේ පිරිනිවන් පෑම | විජය කුමරුගේ ලංකාගමනය |
| උදයභද්ද (රා.කා. වසර 16)<br>අභිෂේකයෙන් 13 වන වර්ෂය<br>15 වන වර්ෂය | - | විජය රජුගේ අභාවය<br>පණ්ඩුවාසදේව රජවීම |

12 ."…..බින්දුසාරො අට්ඨවීසති තස්සාවසානෙ අසොකො රජ්ජං පාපුණි….. අභිසෙකතො අට්ඨාරසමෙ වස්සෙ ඉමස්මිං දීපෙ මහින්ද ථෙරො පතිට්ඨිතො….."

13 . "…..රඤ්ඤො පන අට්ඨවස්සාභිසෙක කාලේ යෙව කුන්තපුත්තතිස්සත්ථෙරො ව්‍යාධිපටිකම්මත්ථං භික්ඛාචාරවත්තෙන ආහිණ්ඩන්තො පසතමත්තං සප්පිං අලභිත්වා ව්‍යාධිබලෙන පරික්ඛීණායුසංඛාරො භික්ඛුසංඝං අප්පමාදෙන ඔවදිත්වා ආකාසෙ පල්ලංකෙන නිසීදිත්වා තෙජො ධාතුං සමාපජ්ජිත්වා පරිනිබ්බායි…."

| | | |
|---|---|---|
| අනුරුද්ධ සහ මුණ්ඩ<br>(රා.කා. වසර 8) | - | |
| නාගදාසක (රා.කා. වසර 16)<br>අභිෂේකයෙන් 20 වන වර්ෂය | - | පණ්ඩුවාසදේව රජුගේ අභාවය සහ අභය රජවීම |
| සුසුනාග (රා.කා. වසර 18)<br>අභිෂේකයෙන් 17 වන වර්ෂය | - | පකුණ්ඩක (පණ්ඩුකාභය) රජවීම |
| කාලාශෝක (රා.කා. වසර 28) | - | |
| දසභාතුක (රා.කා. වසර 22) | - | |
| උග්ගසේන නන්ද, පණ්ඩුක නන්ද, භූතපාල නන්ද, රට්ඨපාල නන්ද, ගෝවිසාණ නන්ද, සවින්ධක නන්ද, කේවට්ටනන්ද සහ ධන නන්ද<br>(රා.කා. වසර 22) | - | |
| චන්ද්‍රගුප්ත (රා.කා. වසර 26)<br>අභිෂේකයෙන් 13 වන වර්ෂය | - | පකුණ්ඩකාභය රජුගේ අභාවය සහ මුටසීව රජවීම |
| බින්දුසාර (රා.කා. වසර 28) | - | |
| අශෝක<br>අභිෂේකයෙන් 17 වන වර්ෂය<br>18 වන වර්ෂය | - | මුටසීව රජුගේ අභාවය සහ දෙවනපෑතිස් රජවීම<br>ලංකාවට මිහිඳු හිමියන් වැඩම කිරීම |

*සමන්තපාසාදිකාවේ* දක්වා තිබෙන මෙම රාජ නාමාවලි සේම රාජ්‍ය කාල සම්බන්ධ තොරතුරු සියල්ල ඓතිහාසික වශයෙන් උසුලනු ලබන වැදගත්කම අමුතුවෙන් කිව යුතු නැත (*ස.පා.-ප.භා.*,2012:42)[14] මෙහිදී ලක්දිව රජුන්ගේ මෙන්ම දඹදිව රජුන්ගේ ද රාජ්‍ය කාලය මෙපමණ

[14]. ".....අජාසත්තුස්ස හි අට්ඨමෙ වස්සෙ සම්මාසම්බුද්ධො පරිනිබ්බායි. තස්මිංයෙව වස්සෙ සීහකුමාරස්ස පුත්තො තම්බපණ්ණිදීපස්ස ආදිරාජා විජයකුමාරො ඉමං දීපමාගන්වා මනුස්සවාසං අකාසි. ජම්බුදීපෙ උදයභද්දස්ස චුද්දසමෙ වස්සෙ ඉධ විජයො කාලමකාසි. උදයභද්දස්ස පඤ්චදසමෙ වස්සෙ පණ්ඩුවාසුදෙවො නාම ඉමස්මිං දීපෙ රජ්ජං පාපුණි. තත්ථ නාගදාසකරඤ්ඤො වීසතිමෙ වස්සෙ ඉධ පණ්ඩුවාසදෙවො කාලමකාසි. තස්මිංයෙව ච වස්සෙ අභයො නාම කුමාරො ඉමස්මිං දීපෙ රජ්ජං පාපුණි. තත්ථ සුසුනාග රඤ්ඤො සත්තරසමෙ වස්සෙ ඉධ අභයරඤ්ඤො වීසති වස්සානි පරිපූරිංසු. අථ අභයස්ස වීසතිමෙ වස්සෙ පකුණ්ඩකාභයො නාම දාමරිකො රජ්ජං අගගහෙසි. තත්ථ කාලාසොකස්ස සොළසමෙ වස්සෙ ඉධ පකුණ්ඩකස්ස සත්තරස වස්සානි පරිපූරිංසු. තානි හෙට්ඨ එකෙන වස්සෙන සහ අට්ඨාරස

වර්ෂ ගණනක්යැයි දක්වා තිබීම කාල අනුක්‍රමය සැදීමෙහිලා මහත් සේ උපකාරී වන්නකි. මෙම තොරතුරු පසුකාලීනව ලියවුණු *පූජාවලිය, සද්ධර්මරත්නාකරය* වැනි මූලාශ්‍රයවල ද දැකගත හැකි නමුත් *සමන්තපාසාදිකාවේ* තරම් ඒවා සවිස්තරාත්මකව දැකගත නොහැකි ය.

*සමන්තපාසාදිකාවේ* කතුවරයා විසින් ලංකාවේ පළමු රජු ලෙස සැලකෙන විජයගේ ලංකාගමනය හා බුද්ධ පරිනිර්වාණය සමකාලීන සිදුවීම් ලෙස දක්වා තිබීම තුළින් බුදු දහම ලංකාවට වැදගත් වන ආකාරය පෙන්වාදීමට උත්සුක වූ බවක් දැකිය හැකිය. එසේම මගධ රාජ පරම්පරාවට අනුව ලංකා රාජ පරම්පරාව දක්වා තිබීමෙන් ශාසන ඉතිහාස සිද්ධි පරම්පරාව ලාංකේය බෞද්ධයාගේ සිතට පහසුවෙන් ඇතුළත් කිරිමට ආධාරකයක් කරගත් බව පෙනේ (ගුණවර්ධන,2005:117).

අවසාන වශයෙන් රාජාභිෂේකයක් පදනම් කොටගෙන කාලය දක්වන සිදුවීම වශයෙන් මහින්දාගමනය හඳුනාගත හැකිය. එහිදී පෙර සඳහන් කළ අන්දමට බුදුන් පිරිනිවීමෙන් දෙසිය තිස්හයවන වර්ෂයේ හා අශෝක රජුගේ අභිෂේකයෙන් දහඅටවන වර්ෂයේ මහින්දාගමනය සිදුවූ බව කීමෙන් නොනැවතී එය දෙවනපෑතිස් රජුගේ අභිෂේකයෙන් වසරකට පසු සිදුවූ බව දක්වමින් (*ස.පා.-ප.භා.*,2012:44)[15] දේශීය මුහුණුවරක් ද එකී සිදුවීමට ලබාදීමට රචකයා උත්සුක වූ බවක් දැකිය හැකිය.

හොන්ති. තත්ථ චන්දගුත්තස්ස චුද්දසමෙ වස්සෙ ඉධ පකුණ්ඩකාභයො කාලමකාසි. මුටසීවරාජා රජ්ජං පාපුණි. තත්ථ අසොකධම්මරාජස්ස සත්තරසමෙ වස්සෙ ඉධ මුටසීවරාජා කාලමකාසි. දෙවානම්පියතිස්සො රජ්ජං පාපුණි. පරිනිබ්බුතෙ ච සම්බුද්ධෙ අජාතසත්තු චතුවීසති වස්සානි රජ්ජං කාරෙසි. උදයභද්දො සොළස, අනරුද්ධො ච මුණ්ඩො ච අට්ඨ, නාගදාසකො චතුවීසති, සුසුනාගො අට්ඨාරස, තස්සෙව පුත්තො කාලාසොකො අට්ඨවීසති, අසොකස්ස පුත්තකා දසභාතුකරාජානො ද්වෙවීසති වස්සානි රජ්ජං කාරෙසුං, තෙසං පච්ඡතො නවනන්දා ද්වෙවිසතිමෙව. චන්දගුත්තො චතුවීසති, බින්දුසාරො අට්ඨවීසති, තස්සාවසානෙ අසොකො රජ්ජං පාපුණි...."

15. "....ස්වායං රාජා තං දිවසං අසොකරඤ්ඤා පෙසිතෙන අභිසෙකෙන එකමාසාභිසිත්තො හොති. විසාඛපුණ්ණමායං හිස්ස අභිසෙකං අකංසු. සො අචිරස්සුතං තං සාසනපවත්තිං අනුස්සරමානො තං ථෙරස්ස සමණා මයං මහාරාජ ධම්මරාජස්ස සාවකා ති වචනං සුත්වා අය්‍යා නුඛො ආගතා ති තාවදෙව ආවුධං නික්ඛිපිත්වා එකමන්තං නිසීදි සම්මොදනීයං කථං කථයමානො....."

## සමාලෝචනය

බුද්ධඝෝෂ හිමියන් විසින් *සමන්තපාසාදිකා* කෘතියේ බාහිර නිදාන වණ්ණනා කොටසින් බුදුන් වහන්සේගේ පරිනිර්වාණයේ සිට ලක්දිව බුදු සසුන පිහිටුවීම සහ අරිට්ඨ තෙරණුවන් ඇතුළු ශිෂ්‍ය පිරිස විනය පිටකය ආචාර්ය පරම්පරාවෙන් රැගෙන ඒම දක්වා වන පුවත ඉදිරිපත් කිරීමේදී හැකිතාක් නිවැරදිව කාලය දක්වමින් ශාසන ඉතිහාසය රචනයට කටයුතු කර තිබේ. එලෙස දක්වන කතා පුවත්වල විශ්වසනීයත්වය අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාවිද්‍යා මූලාශ්‍රය පාදක කොටගෙන තහවුරු කළ හැකිවීම තුළින් *සමන්තපාසාදිකාවේ* බාහිර නිදාන වණ්ණනා කොටසට හිමිවන්නේ ඉහළ වටිනාකමකි.

මෙහිදී ශාසන ඉතිහාසය පිළිබඳ මූලාශ්‍රයක් ලෙස මෙන්ම බෞද්ධ කාලානුගත ක්‍රමය පිළිබඳ පහසුවෙන් අධ්‍යයන කළ හැකි මූලාශ්‍රයක් ලෙස ද *සමන්තපාසාදිකාව* ඉහළ තත්ත්වයක් හිමිකර ගනී. ඒ තුළින් සිදුවීම් අතර අනුක්‍රමිකතාවක් ගොඩනැගීමට හැකිවනවා සේම ඒ ඒ සිදුවීම් සිදුවූ කාලය පාදක කොටගෙන තවත් නිගමනවලට එළඹීමට ඇති හැකියාව මෙනිසා සුලභ කරවයි.

ප්‍රථම ධර්ම සංගායනාවෙන් ඇරඹි බෞද්ධ ඉතිහාසකරණය යටතේ ආචාර්ය පරම්පරාවේ අනුපිළිවෙල අඛණ්ඩව ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා භික්ෂූන් වහන්සේ තුළ පැවති උද්‍යෝගයේ අග්‍රඵලයක් වශයෙන් *සමන්තපාසාදිකාව* හැඳින්වීම නිවැරදි යැයි හැඟේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය


1. *පූජාවලිය* (2009), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
2. *මහාවංසො* (2006), ඉලංගසිංහ, මංගල (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. *වංසත්ථප්පකාසිනී* (1994), අමරවංස හිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර (සංස්.), පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය.
4. *සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා* (2012), පියරතන හිමි, බද්දදේගම, සෝරත හිමි, වැලිවිටියේ සහ රතනසාර හිමි, සිරි සුමංගල (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
5. *සිතියම් සහිත සද්ධර්මරත්නාකරය* (2001), ගුණවර්ධන, වී.ඩී.එස්., සමයවර්ධන ප්‍රකාශන, කොළඹ.
6. *සිංහල සමන්තපාසාදිකා (බාහිර නිදාන)* (1996), ගම්ලත්, සුචරිත සහ වික්‍රමසිංහ, ඊ.ඒ. (සංස්.), එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

**ද්විතීය මූලාශ්‍රය**


1. ඉලංගසිංහ, මංගල (2000), *මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය*, කතෘ ප්‍රකාශන, කැලණිය.
2. ගුණවර්ධන, රණවීර ලෙස්ලි (සංස්.) (2005), *ඉතිහාසයේ අතීතය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. ඤාණවිමල හිමි, බෙල්ලන (2000), *අශෝක ශිලා ලේඛන*, සමයවර්ධන පොත්හල, කොළඹ.
4. චන්ද්‍රරතන හිමි, ලබුහේන්ගොඩ (2006), *පාළි අට්ඨකථා සාහිත්‍යය*, සමයවර්ධන, කොළඹ.
5. Blackburn, B. and Holford-Strevens, L. (1999), *The Oxford Companion to the Year*, Oxford University Press.
6. González, Justo (2010), *The Story of Christianity*, Prince Press.
7. Thee, Francis C.R. (1984), *Julius Africanus and the Early Christian View of Magic*, Mohr Siebeck.